ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ නව ප්‍රවණතා - SNP8246/SNP8336
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.17 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අධ්‍යාපනය දරුවන්ගේ වරප්‍රසාදයක් නොව, එය ඔවුන්ගේ අයිතියකි. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට අනුකූලව ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.
02. දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහතික කරන ජාත්‍යන්තර සම්මුතීන් තුනක් (03) සඳහන් කර ඉන් එකක් (01) කෙටියෙන් පැහැදිලි කරන්න.
03. 'විශේෂ අධ්‍යාපන සේවා' සැපයීමේ අවශ්‍යතා සුදුසු උදාහරණ සහිත ව කෙටියෙන් පැහැදිලි කරන්න.
04. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන සේවා පද්ධතියේ දැනට පවතින අභියෝග පහක් (05) සඳහන් කරන්න.
05. හතරවන තිරසාර සංවර්ධන ඉලක්කය (Sustainable Development Goal -04) කෙටියෙන් පැහැදිලි කරන්න.
06. අවිධිමත් අධ්‍යාපනයේ වාසි පහක් (05) සඳහන් කරන්න.
07. ඒකීකරණය සහ අන්තර්කරණය අතර ප්‍රධාන වෙනස්කම් පහක් (05) ලැයිස්තුගත කරන්න.
08. මාර්ගගත ඉගෙනුමේ (Online learning) අර්ථය සුදුසු උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 08 X05=40)

## 2 වන කොටස

09\. i. උදාහරණ දක්වමින් අධ්‍යාපනය පිළිබඳ ක්‍රියාකාරී පර්යාලෝකය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

ii. එක් එක් පුද්ගලයාගේ සංවර්ධනය සඳහා අධ්‍යාපනය යන සංකල්පයේ සම්බන්ධය දුබලතා සහිත පුද්ගලයින් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. ශ්‍රී ලංකාවේ දුබලතා සහිත පුද්ගලයන් ඔවුන්ගේ පුද්ගල සංවර්ධනයේ දී මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 08)

10\. i. විධිමත් අධ්‍යාපන පද්ධතියේ අර්ථය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. දුබලතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා නොවිධිමත් අධ්‍යාපන ක්‍රමය උපකාර වන ආකාරය උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයේ භාවිතයන් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

11\. i. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ තේරුම ඔබේ වචනවලින් විස්තර කරන්න. (ලකුණු 04)

ii. පුද්ගලයකුට යාවජීව අධ්‍යාපනය ඉතා වැදගත් වේ. ඔබට මෙම ඉගෙනීම ඉටු කළ හැකි ආකාර දෙකක් නම් කරන්න. (ලකුණු 08)

iii. ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමය වැඩිදියුණු කිරීමට විශේෂ අධ්‍යාපන ඒකක පද්ධතිවල සහාය දක්වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

12\. i. පූර්ණ අන්තර්කරණ කිරීම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද, උදාහරණ සහිතව ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. දුබලතා සහිත දරුවන් සඳහා පූර්ණ අන්තර්කරණ කිරීමේ පිළිවෙත්වල වාසි පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා ගැනීමේ දී, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 08)

13\. i. සැමට අධ්‍යාපනයේ ඉලක්ක මානයන් වෙත රජයන්ට කටයුතු කළ හැකි ආකාරය සඳහන් කරන්න. (ලකුණු 05)

ii. සැමට අධ්‍යාපනය සඳහා ඉහත සඳහන් ඉලක්ක සපුරා ගැනීමේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 07)

iii. ශ්‍රී ලංකා රජය විසින් සැමට අධ්‍යාපනයේ ඉලක්ක කෙතරම් දුරට ළඟා කර ගෙන තිබේද යන්න තර්ක කරන්න. (ලකුණු 08)

14\. i. "විශේෂ තත්ත්වයන් යටතේ ස්ථානගත කල දරුවන්" කවුරුන් ද යන්න පැහැදිලි කර සුදුසු උදාහරණ දෙකක් **(02)** ලබා දෙන්න. (ලකුණු 04)

ii. "විශේෂ තත්ත්වයන් යටතේ ස්ථානගත කල දරුවන්ගේ සංඛ්‍යාව ඉහළ යාමට ප්‍රධානතම හේතුව වන්නේ ආර්ථික අර්බුදය සහ ලෝකයේ යුද්ධයයි."

ඉහත ප්‍රකාශය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

iii. ශ්‍රී ලංකාවේ විශේෂ තත්වයන් යටතේ ස්ථානගත කල දරුවන් අප විසින් සංවර්ධනය කරන්නේ කෙසේ ද? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.